# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/06/03/04/2022(43) ඔබේ අංකය / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2022.09.05

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

වාර්ෂික ස්ථාන මාරු - 2022

උක්ත කරුණට අදාළව මා අමතන ලද දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/TR/21 හා 2022.09.05 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් දකුණු පළාත් සභාවේ සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු 2022.10.03 දින සිට ක්‍රියාත්මක කරන ලෙස දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය පරිදි මා හට දැනුම් දී ඇත.

03. ඒ අනුව, 2023.01.01 දින සිට ක්‍රියාත්මක වීමට තිබූ දකුණු පළාත් සභාවේ සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු 2022.10.03 දින සිට ක්‍රියාත්මක කරන ලෙස මින් නියෝග කරනු ලැබේ.

04. එසේම, ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට වාර්තා කළ දිනට පසු දින සිට ක්‍රියාත්මක කළ යුතුය.

05. ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා නොගත යුතු අතර, අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණෙන තෙක් ඔවුන් රඳවා නොගෙන නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කල යුතුය.

ලේකම් / செயலாளர் / Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

06. එකී ස්ථාන මාරු වී යන නිලධාරින්ගේ රාජකාරි ආයතන ප්‍රධානියා හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් නම් කරන නිලධාරියෙකුට භාර දී, නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අදාළ නිලධාරීන් සේවයෙන් නිදහස් කිරීම ඔබගේ වගකීම වන බව අවධාරණය කරන අතර, නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 ප්‍රකාරව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද දන්වමි.

07. එමෙන්ම, නියමිත දිනයේදී ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොකිරීම මත ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව වගකිව යුතු බව මින් අවධාරණය කරන අතර, නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන්ගේ 2022 ඔක්තෝබර් මස වැටුප් හා සියළු දීමනා ගෙවීම නතර කිරීමට පියවර ගන්නා ලෙස ද මින් නියෝග කරමි.

08. එසේම, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියළුම ආයතනවල නිලධාරීන් වෙත ද මෙම ස්ථාන මාරු තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් :

01. සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය - දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - 2022 වාර්ෂික ස්ථාන මාරුවීම්වල ප්‍රගතිය සති 02ක් තුළ මා වෙත දැනුම් දීමට අ.ක.ස.